# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1881/10 - 2014 සැප්තැම්බර් මස 23 වැනි අඟහරුවාදා - 2014.09.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 4/2007.

**1961 අංක 31 දරන ආයුර්වේද පනත**

1961 අංක 32 දරන ආයුර්වේද පනතේ 18 වන වගන්තිය යටතේ ආයුර්වේද වෛද්‍ය සභාව විසින් සාදන ලද රීති.

සභාපති,
ආයුර්වේද වෛද්‍ය සභාව.

2014 සැප්තැම්බර් මස 23 වැනි දින,
කොළඹ දී ය.

රීති

1. මෙම රීති 2013 අංක 01 දරන ආයුර්වේද හෙද නිලධරයන්ගේ (වෘත්තීමය ආචාරධර්ම) රීති යනුවෙන් හඳුන්වන ලබන අතර, එම රීති 2014.10.01 දින සිට ක්‍රියාත්මක විය යුතු ය.

**හෙද සේවයේ වගකීම**

2. හෙදකම විශ්ව අවශ්‍යතාවයකි. එබැවින්,

(අ) සෞඛ්‍ය ප්‍රවර්ධනය
(ආ) රෝග නිවාරණය
(ඇ) සෞඛ්‍යය ප්‍රතිෂ්ඨාපනය
(ඈ) රෝග පීඩාව අවම කිරීම

සෑම ආයුර්වේද හෙද නිලධරයෙකුගේ වගකීම වන්නේ ය.

3. රෝගියෙකුගේ සංස්කෘතික අයිතිය, ජීවිතය හා අභිමතය සඳහා ඇති අයිතිය, අභිමානය සහ ගෞරවාන්විතව සලකනු ලැබීමට ඇති අයිතිය ද ඇතුළුව මානව හිමිකම් වලට ගරු කිරීම හෙද සේවයේ සහජ ලක්ෂණයක් වන්නේ ය. හෙද සේවය ගෞරවනීය වෘත්තියක්

1A - G 20290— 05 (2014/09)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

වන අතර ජාතිය, වර්ගය, වර්ණය, කුළය, සංස්කෘතිය, වයස, ආබාධිත බව හෝ රෝගී බව, ස්ත්‍රී පුරුෂ භාවය, දේශපාලන මතය, ලිංගිකත්වය හෝ සමාජ තරාතිරම යන කරුණු මත සීමා නොවන්නේ ය.

4. ආයුර්වේද හෙද නිලධරයෙකුගේ සේවය තනි පුද්ගලයෙකු පවුල් ඒකකයක් හෝ මහජනයා උදෙසා හෝ වන අතර ඔහු සිය සේවය සැලසීමේදී සෞඛ්‍ය ක්ෂේත්‍රයේ, අනෙකුත් සම්බන්ධිත සේවා සමග සම්බන්ධීකරණයෙන් කටයුතු කළ යුතු වන්නේ ය.

*ආයුර්වේද හෙද නිලධරයා සහ ජනතාව*

5. උවටැන් අවශ්‍ය ජනතාව ආයුර්වේද හෙද නිලධරයෙකුගේ මූලික වෘත්තීමය වගකීම වන්නේ ය. එය ඉටු කිරීම සඳහා සෑම ආයුර්වේද හෙද නිලධරයෙකුම,

(අ) රෝගී වූ පුද්ගලයකුගේ, පවුලක හෝ මහජනතාවගේ මානව හිමිකම්, සාරධර්ම, සිරිත් සහ ආගමික විශ්වාසවලට ගරු කරන පරිසරයක් ඇති කිරීමට උනන්දු විය යුතු ය.

(ආ) උවටැන් සහ අනෙකුත් අදාළ ප්‍රතිකාර කිරීමට අවශ්‍ය කැමැත්ත රෝගියෙකුගෙන් ලබා ගැනීම සඳහා රෝගියකු වෙත නිවැරිදි, කාලීන සහ ප්‍රමාණවත් තොරතුරු ලබා දිය යුතු ය.

(ඇ) රෝගියෙකුගේ පෞද්ගලික තොරතුරු සම්බන්ධයෙන් රහස්‍යභාවය රැකිය යුතු අතර, එවැනි තොරතුරු -

(i) රෝගියා ගේ අවසරය ඇතිව හෙළිදරව් කරන්නේ නම් මිස ;

(ii) රෝගියාගේ යහපත උදෙසා රෝගියාගේ ළඟම ඥාතිවරයෙකුට හෙළිදරව් කරන්නේ නම් මිස ; හෝ

(iii) වෛද්‍ය සභාව යම් අධිකරණයක් හෝ වෙනත් යම් නෛතික අධිකාරියක් විසින් හෙළිදරව් කරන ලෙස නියම කරනු ඇත්නම් මිස,

හෙළිදරව් නොකළ යුතු ය ;

(ඇ) සෞඛ්‍ය සේවා සැපයීමේ දී රෝගීන් අතර සම්පත් බෙදීයාම, සෞඛ්‍යාරක්ෂාව සැලසීම යන කරුණුවල දී සමානාත්මතාව හා යුක්ති සහගත බව පෙන්නුම් කළ යුතු ය.

*ආයුර්වේද හෙද නිලධරයා සහ හෙද සේවය සැලසීම*

6. ආයුර්වේද හෙද නිලධාරියා සැමවිටම හෙද සේවයේ ඉහළම ප්‍රමිතියක් පවත්වාගෙන යා යුතු අතර, අඛණ්ඩ අධ්‍යයනය හා අභ්‍යාසය තුළින් එය පවත්වා ගත යුතු ය.

7. රෝගීන්ට තම සේවය සැලසීමට බාධා නොවන පරිදි හෙද නිලධාරියා තම පෞද්ගලික සෞඛ්‍යය යහපත් මට්ටමකින් පවත්වා ගත යුතු ය.

8. ආයුර්වේද හෙද නිලධාරියා තම වෘත්තියේ ගෞරවනීය බව පිළිබිඹු කෙරෙන හා වැඩිදියුණු වන ආකාරයේ හා මහජන විශ්වාසය දිනාගත හැකි ආකාරයේ හැසිරීමක් පවත්වා ගත යුතු ය.

9. ආයුර්වේද හෙද නිලධාරියකු තම සේවය සැලසීමේ කාර්ය සඳහා තාක්ෂණය හා විද්‍යාත්මකව දියුණු කළ ක්‍රම අනුගමනය කිරීමේ දී ඒවා රෝගියා ගේ ආරක්ෂාවට, ගෞරවයට සහ අයිතිවාසිකම්වලට පටහැනි නොවන බවට වගබලා ගත යුතු ය.

10. ආයුර්වේද හෙද නිලධාරියා ආචාර සම්පන්නව සේවය සැලසීමටත් විවෘතව සංවාදයෙහි යෙදීමටත් ප්‍රයත්න දැරිය යුතු ය.

*ආයුර්වේද හෙද නිලධාරියා සහ හෙද වෘත්තිය*

11. සායනික හෙද සේවාව සැපයීමේදී කළමනාකරණය, පර්යේෂණය හා අධ්‍යාපන අංශවල පිළිගත් ප්‍රමිති නිර්ණය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා ආයුර්වේද හෙද නිලධාරියා දායක විය යුතු ය.

12. ආයුර්වේද හෙද නිලධාරියා වෘත්තීමය ආචාර ධර්ම ඇති කිරීමෙහි හා අඛණ්ඩව පවත්වා ගැනීමෙහි ලා ක්‍රියාකාරීව කටයුතු කළ යුතු ය.

13. ආයුර්වේද හෙද නිලධාරියා ධනාත්මක පොදු සේවයක් සහ සුරක්ෂිත සහ සමාජ ආර්ථික වශයෙන් සාධාරණ සේවා තත්ත්ව නිර්මාණය කිරීමෙහි ලා දායක විය යුතු ය.

14. ආයුර්වේද හෙද නිලධාරියා පරිසරය රැකගැනීමට කටයුතු කළ යුතු අතර සෞඛ්‍යය කෙරෙහි පරිසරයෙන් වන බලපෑම් පිළිබඳ දැනුවත් ව සිටිය යුතු ය.

*ආයුර්වේද හෙද නිලධාරියා සහ අනෙකුත් කාර්ය මණ්ඩලය*

15. ආයුර්වේද හෙද නිලධාරියා ස්වකීය වෘත්තීය සගයන් සහ සෙසු සම්බන්ධිත සෞඛ්‍යය සේවා වෘත්තිකයන් සමග සුහද සම්බන්ධතාවයක් හා සම්බන්ධීකරණයක් පවත්වාගත යුතු ය.

16. සිය කාර්ය මණ්ඩලයේ සාමාජිකයෙකු හෝ වෙනත් යම් පුද්ගලයෙකුගෙන් යම් පුද්ගලයෙකුට, පවුලකට හෝ ප්‍රජාවකට සෞඛ්‍යමය වශයෙන් වන හානිවලින් එම පුද්ගලයා, පවුල හෝ ප්‍රජාව ආරක්ෂා කිරීමට ආයුර්වේද හෙද නිලධාරියා සුදුසු පියවර ගත යුතු ය.

17. ආයුර්වේද හෙද නිලධාරියා වෘත්තීය හැසිරීම වැඩිදියුණු කිරීමට සිය කාර්ය මණ්ඩලයට සහාය විය යුතු ය. මාර්ගෝපදේශකත්වය සැපයිය යුතු ය.

*දඬුවම්*

18. (1) සෑම ආයුර්වේද හෙද නිලධාරියෙකුම මෙහි මින්පෙර සඳහන් කර ඇති රීති වලට අනුකූලව ක්‍රියාකළ යුතු අතර, එම රීති වලින් එකක් හෝ වැඩි ප්‍රමාණයක් කඩ කිරීම වෘත්තීය විෂමාචාරයක් ලෙස සලකනු ලැබේ.

(2) 1973 ආයුර්වේද (විනය) නියෝග යටතේ පවත්වනු ලබන පරීක්ෂණයකින් පසුව වෘත්තීමය විෂමාචාර සිදු කිරීම සම්බන්ධයෙන් වරදකරු බවට තීරණය කරනු ලබන ආයුර්වේද හෙද නිලධාරියකුගේ ලියාපදිංචිය වෛද්‍ය සභාව විසින් අවලංගු කිරීම හෝ අත්හිටුවීම කළ හැකි ය.

(3) (අ) ආයුර්වේද හෙද නිලධාරියකු විසින් වෘත්තීමය විෂමාචාරය පිළිබඳ ක්‍රියාවක් සිදු කිරීම සම්බන්ධයෙන් තීරණය කිරීම සම්බන්ධයෙන් වෛද්‍ය සභාව විසින් මෙම රීතිවල විධිවිධාන වලට පමණක් සීමා නොවනු ඇත.

(ආ) යම් ක්‍රියාවක් සිදු කිරීම මෙම රීතිවලට ඇතුළත් කර නොමැති බවට වෛද්‍ය සභාව විසින් සළකනු ලබන අවස්ථාවක සහ එම ක්‍රියාව සිදු කිරීම මගින් ආයුර්වේද හෙද වෘත්තියට අපකීර්තියක් අත්වන බව වෛද්‍ය සභාවට පෙනී යන අවස්ථාවක වෛද්‍ය සභාව විසින් 1973 ආයුර්වේද (විනය) නියෝග යටතේ නඩු පවරනු ලැබිය හැකි බව සැක දුරු කිරීමේ කාර්ය සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

*අර්ථ නිරූපණය*

19. මෙම රීතිවල කාර්ය සඳහා -

"සභාව" යන්නෙන්, 1961 අංක 31 දරන ආයුර්වේද පනතේ 11 වන වගන්තිය යටතේ පිහිටුවා ඇති ආයුර්වේද වෛද්‍ය සභාව අදහස් වේ.

"ආයුර්වේද හෙද නිලධාරියකු " යන්නෙන් 1961 අංක 31 දරන ආයුර්වේද පනත යටතේ ලියාපදිංචි වී ඇති හෙද නිලධාරියකු අදහස් වේ.

10-349

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.